# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2018

**(AA25) ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම**

(Business Law and Ethics)

---

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 20 ක් සඳහා වන, වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 10කින් සමන්විත විය.

අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සහකර තිබිණි. මෙම ප්‍රශ්නයට වෙන්කර තිබූ සමස්ත ලකුණු සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා ලබා ගැනීමට බහුතරයක් අයදුම්කරුවන් සමත් වී තිබිණි.

ප්‍රශ්න අංක 1.4, 1.6 සහ 1.9 සඳහා නිවැරදිව උත්තර සැපයීමට බොහෝමයක් අයදුම්කරුවන් අසමත් වී තිබූ බව දක්නට ලැබිණි.

ප්‍රශ්න අංක 1.4 සඳහා ඇතැම් අයදුම්කරුවන් වැරදි උත්තර සපයා තිබුනේ, ප්‍රශ්නයේ තිබූ **"නොවන්නේ"** යන්න පිළිබඳ සැලකිලිමත් නොවීම හේතුවෙනි.

ප්‍රශ්න අංක 1.9 ඉතා සරල සහ ඍජු ප්‍රශ්නයක් වුවද, ඒ සඳහා බොහෝ අයදුම්කරුවන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යයන් දෙකක් (2) සඳහන් කිරීමට අසමත් වී තිබිණි.

A කොටස සමත්වීමේ ලකුණට ලගාවීම පිණිස විශාල දායත්වයක් සපයන බැවින්, එම කොටස සඳහා ඉහළ ලකුණු ලබා ගැනීම පිණිස, අයදුම්කරුවන්ට සමස්ත විෂය නිර්දේශය පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය භාණ්ඩ විකිණීමේ අඥාපනත මත පදනම් වී තිබිණි. සමහර අයදුම්කරුවන් දෙන ලද සිදුවීම තුල විස්තරය මගින් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් නිර්මාණය වූ බව සහ ඒ අනුව දෙන ලද අවස්ථාපිත සාධක මත එකී භාණ්ඩ විස්තරය සමග අනුරූප විය යුතු බවට ව්‍යංග කොන්දේසියක් පවතින බව හදුනාගෙන නොතිබිණි. ඇතැම් අයදුම්කරුවන් විසින් දුමින්දට මිලදී ගත් වාහනය සඳහා සිරිපාලගෙන් මුදල් නැවත අයකර ගැනීම සඳහා **හිමිකමක් පවතීද** යන්න පිළිබඳ පැහැදිලි නොකර, අපැහැදිලි ලෙස උත්තර සපයා තිබිණි. තවද, අතලොස්සක් පමණ වූ අයදුම්කරුවන් විසින් දුමින්දට මිලදී ගත් වාහනය සඳහා සිරිපාලගෙන් මුදල් නැවත අයකර ගැනීම සඳහා **හිමිකමක්** පවතී යන්න පමණක් ලියා තිබූ අතර එකී උත්තර, දෙන ලද සිදුවීමේ සිද්ධිමය සාධක මත පදනම්ව තාර්කිකව සහ නිවැරදි න්‍යායාත්මක පදනමක් මත ගොඩනගා නොතිබූ බව දක්නට ලැබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය ප්‍රායෝගික සිදුවීමක් හරහා ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර පිළිබඳව දැනුම පරීක්ෂා කරන ලදී. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට උත්තර සැපයීමට උත්සුක වී තිබූ අතර සතුටුදායක උත්තර සපයා තිබිණි. විභාග අයදුම්කරුවන් ගණනාවක්, දෙන ලද සිදුවීම තුල චෙක්පතක් සාමාන්‍යයෙන් නිකුත් කළ දිනයේ සිට මාස 6 ක් පමණක් වලංගු බව විස්තර නොකර, චෙක්පත් රේඛනය කිරීම් පිළිබඳව පමණක් විස්තර කර තිබිණි. එකී අයදුම්කරුවන් සිද්ධියෙහි දක්වා ඇති චෙක්පත නිකුත් කළ නිශ්චිත දින පිළිබඳව අවධානය යොමුකර නොතිබිණි. ඔවුන් දී ඇති සිද්ධිය තුල චෙක්පත නිකුත් කළ දිනයේ පටන්, මාස 6ක කාලය ඉකුත් වී ඇති බව වටහා නොගෙන, සුනිල්ට පෙරේරා ගෙන් ලද චෙක්පත මුදල් කර ගැනීමට හැකියාව පවතිදැයි පැහැදිලි කර තිබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය අයදුම්කරුවන්ගේ රක්ෂණය පිළිබඳ නීතියට අදාල දැනුම පරීක්ෂා කරන ලදී. විභාග අයදුම්කරුවන් විසින්, රක්ෂණට පිළිබඳ නීතියට අදාල සංකල්පය, සිද්ධිමය සාධක හරහා සාධාරණීකරණය කිරීමක් නොකර, හුදෙක් ඇලිස් විසින් සිය සහෝදරිය ගේ ජීවිතය රක්ෂණය **කිරීම** සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍රය පිළිගැනීමට **සීමාසහිත සේෆ් ලයිෆ් රක්ෂණ සමාගමට** හැකියාවක් තිබේද නැතිද යන්න පමණක් සඳහන් කර තිබෙනු, ඇතැම් අවස්ථාවන්හී දී දක්නට ලැබිණි. අයදුම්කරුවන් ගණනාවක් මෙම සිදුවීමට "රක්ෂණ හිමිකම" (insurable interest) නම් මූලධර්මය ආශ්‍රය කරගෙන උත්තරය සාධාරණීකරනය කර නොතිබූ අතර රක්ෂණයට සම්බන්ධ සෙසු , අදාල නොවන සංකල්පයන් අදාල කර ගෙන තිබේ. මෙහිදී සඳහන් කළ යුතු වන්නේ තම සහෝදරයකුගේ / සහෝදරියකගේ ජීවිතය රක්ෂණය කිරීම පිණිස වෙනත් සහෝදරයෙකුට හෝ සහෝදරියකට රක්ෂණ හිමිකමක් බැදියාවක් නොපවතින බවයි. උත්තර සැපයීමට පෙර ප්‍රශ්නය මැනවින් අවබෝධකර ගැනීම ඉතාමත් වැදගත් වේ.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම හොඳයි.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කළේය. මෙම ප්‍රශ්නය හරහා නෞභාර පත්‍රයක කාර්යයන් විස්තර කිරීම අපේක්ෂා කරනු ලැබිණි. අයදුම්කරුවන් බහුතරයක්, මෙම ප්‍රශ්නය සඳහා සාර්ථකව උත්තර සපයා තිබූ නමුත් සමහර අයදුම්කරුවන් හුදෙක් නෞභාර පත්‍රය පිළිබඳ සඳහන් කර තිබුනද එහි කාර්යයන් විස්තර කර නොතිබිණී. නෞභාර පත්‍රය යනු අදාල ගමනාන්ත තොටුපලට යැවීම පිණිස භාණ්ඩ නැව්ගත කළ බවට, නැව් හිමියා විසින් නිකුත් කරනු ලබන ලදුපතක් බවත්, එය භාණ්ඩ නැව්මගින් ප්‍රවාහනය කිරීම පිණිස ඇති කර ගනු ලබන ගිවිසුම සඳහා සාක්ෂියක් බවත්, එය හිමිකම හැගවීම පිණිස භාවිතා කළ හැකි ලේඛනයක් බවත්, එය රක්ෂණ වන්දි ලබා ගැනීම පිණිස ඉදිරිපත්කළ හැකි බවත්, අයදුම්කරුවන් අවබෝධකර ගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීම හොඳ මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත මත පදනම්වී තිබේ. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත මගින් පිළිගෙන ඇති බුද්ධිමය දේපළ වර්ග දෙකක් (2) පැහැදිලි කිරීම අපේක්ෂා කරන ලදී. ඇතැම් අයදුම්කරුවන් මෙම මාතෘකාව පිළිබඳ දැනුවත්භාවයක් නොතිබූ බව දක්නට ලැබුන අතර සම්පූර්ණයෙන්ම අදාල නොවන උත්තර සපයා තිබෙනු දක්නට ලැබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ. පිටපත් අයිතිය, සලකුණු, පේටන්ට්, වෙළඳ නාම, කාර්මික සැලසුම් සහ භූගෝලීය දර්ශකයන් 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත මගින් පිළිගෙන ඇති බුද්ධිමය දේපළ වර්ග වන බව අයදුම්කරුවන් අවබෝධ කර ගත යුතුය. ඇතැම් අයදුම්කරුවන් හුදෙක් බුද්ධිමය දේපළ වර්ග සඳහන් කිරීම පමණක් සිදුකර තිබූ අතර ප්‍රශ්නය මගින් ඒවා විස්තර කිරීම අපේක්ෂා කරන ලදී.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ.

## C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය භාණ්ඩ විකිණීමේ ආඥාපනත සහ ගිවිසුම් නීතිය සමග සබැඳි සාමාන්‍යයෙන් සරල ප්‍රශ්නයක් වූ අතර ඒ හරහා අශේන්ගේ නෛතික හිමිකම් විමසීම අපේක්ෂා කරන ලදි. බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට ඉතා හොඳින් උත්තර සපයා තිබූ අතර ඉහළ ලකුණු ලබා ගත්හ. ඇතැම් අයදුම්කරුවන් අශේන්ගේ නෛතික අයිතීන් පිළිබඳ සාකච්ඡා නොකර සිද්ධිමය සාධකයන් හී විවිධ පැතිකඩයන් සාකච්ඡා කර තිබිණි. බොහෝ අයදුම්කරුවන් **සීමාසහිත ඔටෝමොබයිල් ලංකා (පෞද්ගලික) සමාගම** සහ අශේන් අතර ගිවිසුමේ තිබූ ප්‍රකාශිත කොන්දේසි සපුරා නොතිබූ බැවින් **සීමාසහිත ඔටෝමොබයිල් ලංකා (පෞද්ගලික) සමාගම** විසින් ගිවිසුම කඩකර ඇති බව තේරුම්ගෙන නොතිබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය කම්කරු නීතිය මත පදනම්වී තිබේ. මෙම ප්‍රශ්නය මගින් ලබා දී ඇති සිද්ධිමය සාධක මත සුනිමල් යනු සේවකයෙක්ද නැතිනම් නිදහස් ගිවිසුම්කරුවෙකුද යන්න සාකච්ඡා කිරීම අපේක්ෂා කරන ලදී. ඇතැම් අයදුම්කරුවන් විසින් සිද්ධිමය සාධකයන් විෂයෙහි අවධානය යොමු කිරීමක් නොකරමින් හුදෙක් සුනිමල් සේවකයෙක් හෝ ස්වාධීන ගිවිසුම්කරුවෙකු වශයෙන් සඳහන් කර තිබිණි. කම්කරු නීතිය ප්‍රකාරව පාලනය පිළිබඳ පරීක්ෂණය, උපකරණ පිළිබඳ පරීක්ෂණය, ඒකාබද්ධතා පිළිබඳ පරීක්ෂණය සහ ආර්ථික යථාර්ථය පිළිබඳ පරීක්ෂණය යනුවෙන් පුද්ගලයකුගේ සේවකභාවය මැනීම පිණිස සහය වන පරීක්ෂණයන් හතරක් පවතින බව අයදුම්කරුවන් විසින් අවබෝධ කර ගත යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සිද්ධිමය සාධක මත පදනම්ව තාර්කිකව අවසාන නිගමනයට පැමිණීම අවශ්‍ය බව හඳුනාගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 09

මෙය හවුල් ව්‍යාපාර සම්බන්ධ ඉතා සරල ප්‍රශ්නයකි. මෙහි (අ) කොටසින් සිද්ධිමය සාධක මත පදනම් වී හවුල්කරුවෙකු වශයෙන් කමල් විසින් කඩ කළ වගකීම් පිළිබඳව සාකච්ඡා කිරීම අපේක්ෂා කළ අතර, (ආ) කොටසින් 1890 හවුල් ව්‍යාපාර පිළිබඳ ආඥාපනතේ අන්තර්ගත හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් හතරක් (4) සඳහන් කිරීම අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බොහොමයක් මෙහි (අ) කොටසට හොඳින් උත්තර සපයා තිබූ අතර ඉහළ ලකුණු ලබා ගත්හ. ඇතැම් අයදුම්කරුවන් කමල් විසින් කඩකරන ලද වගකීම් පිළිබඳව සාකච්ඡා නොකර, හවුල්ව්‍යාපාර නීතියේ විවිධ පැතිකඩයන් දෙන ලද සිද්ධිමය සාධක ආශ්‍රිතව විග්‍රහ කර තිබිණි. හවුල් ව්‍යාපාර නීතිය ප්‍රකාරව, හවුල් ව්‍යාපාරය සමග තරගකාරී සමාන ව්‍යාපාරයක් පවත්වාගෙන නොයෑමට සෑම හවුල්කරුවෙකුටම වගකීමක් පවතින බව අයදුම්කරුවන් විසින් අවබෝධ කර ගත යුතුය. එලෙස යම් අවස්ථාවක යම් හවුල්කරුවෙකු එසේ කරයි නම් එලෙස උපයා ගත් ලාභ සියල්ල ඔහු නැවත හවුල්ව්‍යාපාරයට ගෙවිය යුතුය.

(b) කොටස ඍජු සහ සරල ප්‍රශ්නයක් වූ අතර බහුතරයක් අයදුම්කරුවන් විසින් ඒ සඳහා 1890 හවුල් ව්‍යාපාර අඥාපනතේ අන්තර්ගත වු අයිතිවාසිකම් සහ වගකීම් නිවැරදිව සඳහන් කර තිබුණි. ප්‍රශ්නය තුල පැහැදිලිව ''සඳහන් කරන්න'' යනුවෙන් දක්වා තිබුනද ඇතැම් අයදුම්කරුවන් විසින් දීර්ඝ විස්තරාත්මක උත්තර සපයා තිබිණි. ප්‍රශ්නය මගින් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න උත්තර සැපයීමට පෙර වටහාගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## <u>D කොටස</u>

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නය කොටස් 02 කින් සමන්විත වේ. මෙම ප්‍රශ්නයේ (a) කොටස <u>ගිවිසුම් නීතිය</u> මත පදනම් වී තිබිණි.

මෙම ප්‍රශ්නයේ (a) කොටස (i) සඳහා, ගිවිසුම් නීතියේ ගෘහස්ථ ගිවිසුම් විෂයෙහි අවධානය යොමු කරමින් සිද්ධිමය සාධක මත, කුමාර් සිය සීයාගෙන් BMW මෝටර් රථයක් ලැබීමට හිමිකම් ලබයිද යන්න සාකච්ඡා කිරීම අපේක්ෂා කරනු ලැබීය. මෙම කොටස බහුතරයක් අයදුම්කරුවන් විසින් හොඳින් උත්තර සපයා තිබිණි. කෙසේවුවද, ඇතැම් අයදුම්කරුවන් විසින් ප්‍රශ්නයේ සිද්ධිමය සාධකයන්ම පමණක් නැවත සඳහන් කරමින් ගිවිසුම් නීතිය පිළිබඳ කිසිදු සඳහනක් නොකර උත්තර සපයා තිබිණි. එම අයදුම්කරුවන් කුමාර් තම සීයාගෙන් මෝටර් රථයක් ලැබීමට හිමිකම් ලබනවාද යන්න පිළිබඳ නිගමනයකට එළඹ නොතිබිණි.

මෙම ප්‍රශ්නයේ (a) (ii) කොටස සඳහා, ගිවිසුම් නීතියේ බාලවයස්කරුවන් විසින් එළඹෙන ගිවිසුම් විෂයෙහි අවධානය යොමු කරමින් සිද්ධිමය සාධක මත, රවී සිය නැන්දනියට තම රැකියාවේ පළමු වර්ෂයේ වැටුප ගෙවීම යුතුද යන්න සාකච්ඡා කිරීම අපේක්ෂා කරනු ලැබීය. ඇතැම් අවස්ථාවන්හිදී අයදුම්කරුවන් අදාල නොවන කරුණු සඳහන් කර තිබූ අතර ඇතැම් අවස්ථාවන්හිදී උත්තර වශයෙන් අයදුම්කරුවන් ප්‍රශ්නයේ තිබෙන කරුණුම නැවත සඳහන් කර තිබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

(b) කොටස <u>නියෝජ්‍යාත්ව පිළිබඳ නීතිය</u> මත පදනම් වී තිබිණි.

මෙම ප්‍රශ්නයේ (b) (i) කොටස මගින්, ලබා දී ඇති සිද්ධිමය සාධක මත පාල විසින් සිරීගේ නියෝජිතයකු වශයෙන් ඔහු වෙත ඇති වගකීම් කිසිවක් කඩකර තිබේද යන්න පිළිබද සාකච්ඡා කිරීම අපේක්ෂා කරන ලදී. ඇතැම් අයදුම්කරුවන් විසින් මෙම සිදුවීම ගිවිසුම් නීතිය සමග පටලවාගෙන තිබූ අතර අදාල නොවන පිළිතුරු සපයා තිබිණි. නියෝජ්‍යාත්ව නීතිය ප්‍රකාරව නියෝජිතයන් විසින් තම ප්‍රධානියා විසින් දෙනු ලබන උපදෙස් පිළිපැදිය යුතු අතර තම බලය ඉක්මවා කටයුතු නොකළ යුතු බව අයදුම්කරුවන් විසින් අවබෝධ කර ගත යුතුය. තවද, නියෝජිතයා විසින් රහසිගත ලාභ නොලැබිය යුතුය.

මෙම ප්‍රශ්නයේ (b) (ii) කොටස මගින් තම මුදල් නැවත අයකර ගැනිම සම්බන්ධයෙන් පෙරේරා සතු අයිතිවාසිකම් සාකච්ඡා කිරීම අපේක්ෂා කරන ලදී. ඇතැම් අයදුම්කරුවන් විසින් අදාල නෛතික අයිතිවාසිකම් පිළිබද සාකච්ඡා නොකර හුදෙක් ප්‍රශ්නයේ දී ඇති සිද්ධිමය සාධකයන්ම නැවත ලියා දක්වා තිබිණි. නියෝජ්‍යාත්ව නීතිය ප්‍රකාරව නියෝජිතයන් විසින් තම ප්‍රධානියා විසින් දෙනු ලබන උපදෙස් පිළිපැදිය යුතු බව අයදුම්කරුවන් විසින් අවබෝධ කර ගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සදහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක නොවේ.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කල යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.
3. "කල යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව" විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්නය තුල භාවිත කර ඇති **<u>කළ යුතු ක්‍රියාව</u>** තුලින් බලාපොරොත්තු වන පිළිතුර ක්‍රියා නිර්වචනයට අනුකූල වන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.
4. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදීය මැනැවින් පරිශීලනය කිරීම.
5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.
6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
9. ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.
10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.
12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -